# ශිෂ්‍ය අත්පොත

## බාහිර උපාධි පාඨමාලා

## 2021

දුරස්ථ සහ අඛණ්ඩ
අධ්‍යාපන කේන්ද්‍රය



කැලණිය විශ්වවිද්‍යාලය
University of Kelaniya
களனிப் பல்கலைக்கழகம்

# කැලණිය විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

## බාහිර උපාධි පාඨමාලා

# ශිෂ්‍ය අත්පොත
# 2021

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

**www.cdce.kln.ac.lk**

# ප්‍රකාශනය -2022


## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## කැලණිය විශ්වවිද්‍යාලය

(ISBN-978- 955 – 704 – 065 - 3)

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | - | 2002 |
| දෙවන මුද්‍රණය (සංශෝධිත) | - | 2004 |
| තෙවන මුද්‍රණය (සංශෝධිත) | - | 2005 |
| සිව්වන මුද්‍රණය (සංශෝධිත) | - | 2007 |
| පස්වන මුද්‍රණය (සංශෝධිත) | - | 2008 |
| හයවන මුද්‍රණය (සංශෝධිත) | - | 2009 |
| සත්වන මුද්‍රණය (සංශෝධිත) | - | 2010 |
| අටවන මුද්‍රණය (සංශෝධිත) | - | 2011 |
| නවවන මුද්‍රණය (සංශෝධිත) | - | 2015 |
| දහවන මුද්‍රණය (සංශෝධිත) | - | 2022 |
| එකළොස්වන මුද්‍රණය (සංශෝධිත) | - | 2022 |

උපදේශක - ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි.

සංස්කරණය - මහාචාර්ය මල්වානේ චන්දරතන හිමි.

සංස්කරණ සහය - තරිඳු ජයවර්ධන මයා

පරිගණක අක්ෂර - උපේන්ද්‍රා ප්‍රේමචන්ද්‍ර මෙය /තරිඳු ජයවර්ධන මයා

පිටකවරය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දර්ශන මාපා මයා

# කැලණිය විශ්වවිද්‍යාලය

පණ්ඩිතාචාර්ය රත්මලානේ ධර්මාලෝක මාහිමියන් විසින් 1875 නොවැම්බර් මස පළමුවන දින ආරම්භ කළ පැලියගොඩ විද්‍යාලංකාර පිරුවනින් 1959 සැප්තැම්බර් මස 17 වන දින විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් සරසවියක් බිහි වන්නේ දේශීය අධ්‍යාපනය නගා සිටුවීමේ ප්‍රශස්ත සංකල්පත් නූතන ලෝකයට අවශ්‍ය ශාස්ත්‍ර ගවේෂණයෙහි යෙදෙන ප්‍රාමාණික විද්වතුන් බිහි කිරීමේ උදාර අභිලාෂත් පෙරදැරි කරගෙනය. යථෝක්ත විද්‍යාලංකාර පිරුවෙන්හි පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියන් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතීන් වහන්සේ ලෙස පත් වූහ. කැලණිය විශ්වවිද්‍යාලය මඟින් දශක හයකට අධික කාල පරිච්ඡේදයක් තුළ ශබ්ද ශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා කළ විශිෂ්ට මෙහවර නිසාම එය දෙස් විදෙස් වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වී ඇති සරසවිය බව සඳහන් කළ යුතුය. සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ධර්මාරාම මාහිමි, පණ්ඩිත ශිරෝමණී ලුණුපොකුනේ ධම්මානන්ද මාහිමි, පණ්ඩිතාචාර්ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමි, සාර්වභෞම පණ්ඩත යක්කඩුවේ පඤ්ඤාරාම නාහිමි, පණ්ඩිතාචාර්ය නාත්තණ්ඩියේ පඤ්ඤාකර නාහිමි, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමි යන පරිවේණාධිපතීන් වහන්සේලා මෙම ශාස්ත්‍ර නිකේතනයේ අභිවෘද්ධිය පිණිස මහඟු මෙහවරක් ඉටු කළ යතීන්ද්‍රයන් වහන්සේලා අතර ප්‍රධාන වෙති.

1972 අංක 01 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනත මඟින් ශ්‍රී ලංකාවේ සියලුම විශ්විද්‍යාල එකම විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබුණු අවස්ථාවේදී 1972 පෙබරවාරි 15 වන දින සිට මෙම විශ්වවිද්‍යාලය **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය"** බවට පත් විය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් 1978 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ව්‍යුහය වරක් සංශෝධනය කරනු ලැබුණු අවස්ථාවේදී යථෝක්ත මණ්ඩපය **"කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව"** ලෙසින් නැවත වරක් ස්වායත්ත විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබිණ. 1958 පනත අනුව ආරම්භයේදී ගිහි පැවිදි ශිෂ්‍යයන් පමණක් ඇතුළත් කරගනු ලැබුණු මෙම ආයතනයට, 1966 අංක 20 දරන , ජාතික උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරනු ලැබීමත් සමගම ශිෂ්‍යාවන් ද ඇතුළත් කරගත හැකි විය. ආරම්භයේදී පැලියගොඩ පිරිවෙන් භූමියෙහිම පිහිටවනු ලැබුණු මෙම විශ්වවිද්‍යාලය ඉඩකඩ මද වීම නිසා නොබෝ කලකින් වෙනත් භූමි භාගයකට ගෙන යාමේ අවශ්‍යතාව පෙනෙන්නට විය. ඒ අනුව දැනට විශ්වවිද්‍යාලය පිහිටුවා තිබෙන මෙම භූමි භාගයට 1975 වන විට විශ්වවිද්‍යාලයේ සියලුම අංශ ගෙන එනු ලැබිණ. මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබුණු 1959 දී එය ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර, භූගෝල විද්‍යාව, බෞද්ධ අධ්‍යයන හා දර්ශනය, ආර්ථික විද්‍යාව, ගණිතය හා අධ්‍යාපන විද්‍යාව වැනි විෂය කීපයකට පමණක් සීමා වුව ද අද එය මානව ශාස්ත්‍ර සමාජීය විද්‍යා, විද්‍යා, වෛද්‍ය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක තාක්ෂණය සහ පශ්චාත් උපාධි අධ්‍යයන වශයෙන් හැඳින්වෙන පීඨ හතකින් සහ අධ්‍යයන අංශ 44 කින් සමන්විත වූ, ඊට අධික විෂය සම්භාරයක් පිළිබඳ උපාධි අධ්‍යයන, පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කාර්යයෙහි නිරත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවට පත්ව ඇත.

# කුලපති සහ විශ්වවිද්‍යාල නිලධාරිහු

| |
|---|
| **කුලපති**<br>ශ්‍රී කල්‍යාණි උභය රජමහා විහාරාධිපති පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විශ්‍රාමික මහාචාර්ය අග්ගමහා පණ්ඩිත ආචාර්ය අතිපූජ්‍ය කොල්ලුපිටියේ ශ්‍රී මහින්ද සංඝරක්ඛිතාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ |
| **උපකුලපති**<br>විනේතෘ මහාචාර්ය. නිලන්ති ද සිල්වා මිය<br>*M.B.B.S (C'bo),M.Sc. (Lond), MD(C'bo),FNASSL* |
| **පීඨාධිපති- මානවශාස්ත්‍ර පීඨය**<br>ආචාර්ය යූ. සුදත් සෙනරත් මයා<br>*B.A(Kel'ya) M.Phil(Kel'ya) Ph.D(Kel'ya)* |
| **පීඨාධිපති - වෛද්‍ය පීඨය**<br>මහාචාර්ය ජානකී ඩී එස් හේවාවිසාන්ති මිය<br>*M M.B.B.S (C'bo)Dip.Path (C'bo),MD Hist.Path (C'bo)* |
| **පීඨාධිපති - විද්‍යා පීඨය**<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්. ආර්. ඩී. කාලිංගමුදලි<br>*B.Sc(Kel'ya),Ph.D. (Sheffield)), CSci., CEng.CPhys. FIET.Finstp. FIP(SL).MIEEE* |
| **පීඨාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය**<br>ආචාර්ය පී. එන්. ඩී. ප්‍රනාන්දු මයා<br>*B.B.Mgt.(Acc) (Kel'ya), MBA (WBUT), Ph.D. (CCNU)* |
| **පීඨාධිපති - සමාජීය විද්‍යා පීඨය**<br>මහාචාර්ය එම්. එම්. ගුණතිලක මයා<br>*B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya )* |
| **පීඨාධිපති- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ. එම්. ඩී. ආරියරත්න මයා<br>*B.Com. (Kel' ya), M.Com. (Kel' ya), Ph.D. (USQ Australia ) FCA* |
| **පීඨාධිපති - පරිගණක හා තාක්ෂණය පීඨය**<br>ආචාර්ය චම්ලි පුෂ්පකුමාර මයා<br>*B.Sc (Kel' ya), Ph.D(UK)* |
| **ලේඛකාධිකාරී**<br>කේ.කේ.කේ ධර්මතිලක මයා<br>*BA Hons (Economics), PGDBFA, MSSc(Economics), MBA* |
| **පුස්තකාලයාධිකාරී**<br>ආචාර්ය. සී.සී. ජයසුන්දර මයා<br>*BA Statistic (Ruhuna),PgCE(Birmingham City) ,MSc(Sheffield), DLitt(South Africa) AALIA(Australia)* |
| **මූල්‍යාධිකාරී**<br>යූ. ටී. එම්. අයි. ඩී. තෙන්නකෝන් මිය<br>*B.Sc. (S.J'pura), ACA (ICASL)* |

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

| | |
|---|---|
| **අධ්‍යක්‍ෂ**<br>පූජ්‍ය ආචාර්ය ඩී. ධම්මදස්සි හිමි<br>*B A¸ M. A¸M.SC (Uok) Dip in Arch(Kel'ya), Ph.D(Uok)* |  |
| | |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉගෙනුම් සම්පත්**<br>ආචාර්ය එම්. පී. එන්. ජනාදරී මිය<br>B.B.Mgt. (HRM) (Kel’ya), M.Sc. (S.J'pura), Ph.D (UUM) |  |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ - ලියාපදිංචි හා විභාග**<br>මහාචාර්ය ඉන්දිකා අනුරින් දිවාකර.<br>B.A (Kel’ya)M.A(Kel’ya) M Phil(Kel’ya).Ph.D (C'bo) |  |
| **නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු**<br>මහාචාර්ය ආර්.ඒ සීතා ප්‍රියංගනි මිය<br>B.A(Kel᾿ya) MSSc(Kel᾿ya)M. A (Waseda)<br>P.G Dip(S. J’pura). Ph.D (New Zeland) |  |
| **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**<br>එස්. මනිවන්නන් මහතා<br>B.Sc. in Mathematics |  |
| **ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි**<br>පී එච් යු නිශ්ශංක මහතා<br>HNDA, CBA |  |

<u>**කැලණිය විශ්වවිද්‍යාලයීය ගීතය**</u>

සිය දෙස කිතු ගොස

උරුමය සුරකින

සියත් සුවඳ විදු කිරණ බෙදා දෙන

සරා සඳකි විදුලකර උදාගිර

කැලණිය සරසවි මාතා ...........//

සතර සයුර වී - දූයට නුවණ දෙන

සත් සිළුමිණ වී - ඉසුරු සදාලන

දූයේ ජීව උල්පත වන් නොසිඳෙන

කැලණිය සරසවි මාතා ...........//

සුනිසිත සුවියත් පිවිතුරු නැණ ගුණ

යුගයෙන් යුගයට දූයට තිළිණ කර

තරු පිරිවර සහ මුළු ලොව සරසන

කැලණිය සරසවි මාතා ........

විදු අඹරේ බැබලේවා ........

සිය දෙස කිතු ගොස ...........//

පද රචනය : මහාචාර්ය දර්ශන රත්නායක

සංගීතය සහ තනු නිර්මාණය : කලාකීර්ති රෝහණ වීරසිංහ

## උපකුලපතිතුමියගේ පණිවුඩය



ප්‍රිය සිසු දරුවනි,

ලොව ජනිත වන මානවයින්ගේ සමාජ සංපර්කය හේතුකොටගෙන රැස්කරගන්නා දැනුම් සම්භාරය එකී දේශයෙහි සෑම අංශයකම ප්‍රගමනයට හේතු වන බව පැහැදිලි කරුණකි. එකී දැනුම් සම්භාරය මානව සමාජයේ අභිවෘද්ධිය පිණිස මනා කළමනාකරණයකින් භාවිත කිරීමට ඔවුන් සතුව පවතින ප්‍රඥාව මැනවින් ඉවහල් වේ.

එසේම එකී දැනුමත් ප්‍රඥාවත් හේතුකොටගෙන ගන්නා තීරණ ලෝකයේ යහපැවැත්මට හේතු වන්නේ මානව ධර්මතා නම් උත්තරීතර ගුණය මුල්කොටගෙන බව ලෝක ඉතිහාසය මධ්‍යස්ථව නිරීක්ෂණය කිරීමෙන් මනාව අවබෝධ වේ.දැනුම අවශ්‍ය වන්නේ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමටය. පරිපූර්ණ විද්‍යාර්ථියෙකු බිහි කිරීමට දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. දෛනිකව මිනිසා මුහුණදෙන ගැටලු රාශියක් ද ඇත. එම ගැටලුවලට ඇත්තේ පිළිතුරු නොවේ. ගැටලුවලට ඇත්තේ විසඳුම්ය. එය දැනුමෙන් පමණක් විසදාගත නොහැකිය. එහිදී මහෝපකාරී වන්නේ ප්‍රඥාවයි. එම නිසා දැනුමත් ප්‍රඥාවත් දෙකින්ම සරසවි විද්‍යාර්ථියා පෝෂණය විය යුතුය. මුලින් සඳහන් කළ පරිදිම දැනුම හා ප්‍රඥාව මානව ධර්මයන් සමග සංකලනය වීමෙන් අර්ථ සම්පන්න විද්‍යාර්ථියෙකු බිහිකර ගත හැකිය. එම නිසා දැනුම කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ ප්‍රාමාණික විද්‍යාර්ථියෙකු බිහි කිරීම අපගේ එකම බලාපොරොත්තුව බව විශේෂයෙන්ම සඳහන් කරමි.

ඔබ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ලබන කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ කීර්තිමත් ඉතිහාසයක් තිබෙන විශිෂ්ට අධ්‍යාපන ආයතනයකි. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් 1959 විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් ආරම්භව පසුව විද්‍යාලංකාර මණ්ඩපය නමින් ද වර්තමානයෙහි කැලණිය විශ්වවිද්‍යාලය නමින් ද හඳුන්වන ලබන මෙම සරසවියෙහි ආරම්භය විද්‍යාලංකාර පිරිවෙනේ ආරම්භය දක්වා ඈතට දිව යයි. 1875 නොවැම්බර් 01 වන දින රත්මලානේ ධර්මාලෝක මහා ස්වාමීන්දයන් වහන්සේ විසින් ආරම්භ කළ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන 19 වන සියවසෙහි දෙවන අර්ධයෙහි පහළ වූ පෙරදිග අධ්‍යාපනයේ විශිෂ්ට තක්ෂිලාවක් ලෙස පෙර අපර දෙදිග වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වූ විද්‍යාස්ථානයක් බව සඳහන් කරන්නේ සාඩම්බර හැඟීමෙනි.

1993 වර්ෂයේ කලා සහ වාණිජ පාඨමාලාවලින් පමණක් ආරම්භ වූ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා, 1999 වසර වන විට විද්‍යාවේදී සහ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලා සහිතව පවත්වාගෙන යාමට හැකි වූයේ ශීඝ්‍ර ප්‍රගතියක් ප්‍රදර්ශනය කරමිනි. වර්තමානය වන විට දහස් ගණනක සිසුන්ගේ ප්‍රාර්ථනා ඉටු කෙරෙන අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙම ආයතනය පත්ව තිබෙන බව පවසනුයේ හද පිරි සතුටිනි.

බාහිර උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ආයතනයට බැඳුණ දා සිට උපාධිධාරියෙකු වශයෙන් සමාජයට අනුයුක්ත කරනු ලබන දින දක්වා අවශ්‍ය සියලු කටයුතු නිරවුල්ව සහ සාර්ථකව මෙම ආයතනයෙන් සිදුකරගැනීමේ හැකියාව ලැබීම ඔබ ලද භාග්‍යයකි. විශේෂයෙන්ම සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරව රැකියා වෙළඳපොළ අරමුණු කරගත් පාඨමාලා මඟින් උගත්, බුද්ධිමත් පරපුරක් සමාජයට මුදා හැරලීමේ හැකියාව අපට හිමි වූයේ, නව විෂයමාලා හඳුන්වා දෙමින් ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය වැනි උපාධි පාඨමාලාවන්ට අන්තර්ගත කරලීමට හැකි වූ නිසා ය. එහි උපරිම ඵල නෙලා ගැනීමේ යුතුකම මෙන්ම වගකීම ද ඔබ සතු වන බව මේ අවස්ථාවේදී සිහිපත් කරමි.

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ඔබ ලියාපදිංචි වන්නේ යම් දිනකදී ද එදින සිට ඔබ උපාධිලාභියෙකු වන දින දක්වා සියලු කටයුතු අන්තර්ජාලය ඔස්සේ සිදු කිරීම ඔබ ලද ජයග්‍රහණයකි. ඒ මඟින් ඔබ ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන පුද්ගලයෙකු වශයෙන් පමණක් නොව, නවීන ලෝකය සමඟ නව දැනුමෙන් කටයුතු කළ හැකි අයෙකු බවට ද නිරායාසයෙන්ම පත් වෙයි. අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට නොහැකිව ඉච්ඡාභංගත්වයට පත් වූ සිසුන් එකී මානසික තත්ත්වයෙන් දුරස් කරලීමට කැලණිය විශ්වවිද්‍යාලයේ  දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමත් වූ බව දීර්ඝ කාලයක් පුරාවට අප විසින් බිහි කරනු ලැබූ උපාධිධාරීන් ප්‍රබල සාධකයකි.

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධයෙන් විවේචනාත්මක අදහස් ඉදිරිපත් වන මෙවන් යුගයක, එකී අදහස් නිස්සාර වූවක් බවට පත් කරලීමේ හැකියාව ලැබුණේ කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් නවීන තාක්ෂණය භාවිත කරමින් විද්‍යාර්ථීන් හට ඉගෙනුම් ක්‍රියාවලියට අවශ්‍ය වන පහසුකම් සැලසීම හේතු කොටගෙනය. මෙම සියලු ක්‍රමවේදයන්වල නිසි ප්‍රයෝජන ලබා ගැනීමේ වගකීම ඔබ සතු වන බව ද අමතක නොකළ යුතුය.

කැලණිය විශ්වවිද්‍යාලය සතුව පවතින්නා වූ කීර්තිමත් නාමය එලෙසින්ම ආරක්ෂා කරමින් ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව ඉටු කරගෙන රටෙහි ජාතියෙහි ශබ්දශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා නිරන්තරයෙන්ම ඔබ කැපවිය යුතුය. ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපතිනිය
කැලණිය විශ්වවිද්‍යාලය
2022.04.11



# අධ්‍යක්ෂ ස්වාමීන්වහන්සේගේ පණිවුඩය

ප්‍රිය විද්‍යාර්ථියනි,

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛන අංක 932/2010, 20/2017 හා 01/2021 අනුව සකස් කරන ලද ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය/විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය/වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය යන විෂය නිර්දේශයන්ට අනුව, වි.වි.ප්‍ර. කොමිෂන් සභාව විසින් 2017 වසරේදී අත්හිටුවන ලද, ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන ලෙසට දැනුම් දී ඇත. ඒ ක්‍රම වේදයට අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයන්ට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධි බාහිර පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කරන මේ මොහොතේ ඉතා වැදගත් කාරණා කිහිපයක් ඔබට මතක් කර දීම අත්‍යවශ්‍ය වේ.

වසරින් වසර ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහිවන බාහිර උපාධිධාරීන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම නිසා වි.වි.ප්‍ර. කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවලට අභ්‍යන්තරව බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් බඳවා ගැනීමටත් විෂයයන් කිහිපයක් සඳහා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වීම වළක්වා ලීම සඳහා එක් විෂයකට 25% ක් පමණක් උසස් පෙළ ඉසෙඩ් අගය (z.score) මත බඳවා ගන්නා ලෙසත් ඉහත චක්‍ර ලේඛන හා අංක මගින් දන්වා ඇත. ඒ අනුව සකස් කරන ලද නිර්ණායකයන්ට අනුව ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන බව ඔබ විසින් අවබෝධ කරගත යුතු ප්‍රධානතම කාරණයකි.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් පිටුව ඔබට පහසුවෙන් පරිහරණය කළ හැකි පරිදි අලුතින් නිර්මාණය කොට ඇති අතර එයට පිවිසීමෙන් ශිෂ්‍ය අත්පොත/ප්‍රවේශ නිර්ණායක/ විභාග නිර්ණායක/ අතිරේක නීතිරීති වැඩි විස්තර සහිතව බලාගත හැක. එසේම වෙබ් පිටුවේ ඇති LMS පිටු /Zoomදේශන / Zoom සම්මන්ත්‍රණ දේශන හා ඉලෙක්ට්‍රොනික් පුස්තකාලය සඳහා ලියා පදිංචියෙන් පසු ඔබට ප්‍රවේශ විය හැක.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සෘජුවම සිසුන් සමග සම්බන්ධතා පවත්වන ආයතනය වුවත් සියලු විෂය නිර්දේශ, ප්‍රවේශ හා විභාග නිර්ණායක ඇතුලු වෙනත් නීතිරීති, ප්‍රතිපත්ති සකස් කිරීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, උත්තර පත්‍ර බැලීම හා ලකුණු ලේඛන ඇගයීම, විවිධ කාර්යයන් සඳහා ආචාර්යවරුන් පත් කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ විවිධ මණ්ඩල හා සභා වලින් සිදු වේ. එවා නම් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය, පීඨ සභා, ප්‍රවේශ කමිටුව, අභියාචනා කමිටුව, විභාග අක්‍රමිකතා කමිටුව, නිළ චාරිත්‍ර කමිටුව, විභාග අංශය, ශාස්ත්‍රීය අංශය, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව, සනාතන සභාව හා පාලක සභාවයි. ඒ අනුව දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ස්වාධීන අධ්‍යාපන ආයතනයක් නොව කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලනයට යටත් වූ ආයතනයක් ලෙසත් අභ්‍යන්තර උපාධිධාරියෙකු බිහි කරන ආකාරයේම මැදිහත් වීමක් බාහිර උපාධිධාරීන් බිහිකරලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් සිදුකරන බවත් ඔබ විසින් තේරුම් ගතයුතු අත්‍යවශ්‍යම කාරණයකි.

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ බාහිර උපාධිය සඳහා ලියාපදිංචි වී උපාධිය අවසන් කර ගැනීමට නොහැකි වූ අතිවිශාල ශිෂ්‍ය පිරිසක් දැනට සිටින බව ඔබ දන්නා අතර ඔහුනගේ ප්‍රශ්න සාධාරණ ලෙස විසඳීමට දැනටමත් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත. පැවැත්වීමට නොහැකි වූ විභාග දිගටම පැවැත්වීම 2021 දෙසැම්බර් මස සිට ආරම්භ කොට ඇත. පැවැත්වූ සියලු විභාගවල ප්‍රතිඵල නිකුත් කොට ඇත. තවද නියමිත කාලය ඉක්ම වූ හෝ අවසාන වසර විභාගවලට පෙනී සිට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ විද්‍යාර්ථීන්ට අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කොට ඇත්නම් මානවශාස්ත්‍ර ඩිප්ලෝමාව / සමාජීයවිද්‍යා ඩිප්ලෝමාව / වාණිජ විද්‍යාවේදී ඩිප්ලෝමාව / ව්‍යාපාර කළමනාකරණවේදී ඩිප්ලෝමාව හෝ සම්භාර 60ක් සම්පූර්ණ කොට ඇත්නම් මානවශාස්ත්‍ර උසස් ඩිප්ලෝමාව / සමාජීයවිද්‍යා උසස් ඩිප්ලෝමාව / වාණිජ විද්‍යාවේදී උසස් ඩිප්ලෝමාව / ව්‍යාපාර කළමනාකරණවේදී උසස් ඩිප්ලෝමාව විද්‍යාර්ථීන්ගේ ඉල්ලීම පරිදි ඉදිරියේ දී ලබා දීමට කටයුතු සැලසුම් කොට ඇත.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් මෙතෙක් සිදු වූ අතපසු වීම් සියල්ල මග හරවා ගෙන නව ප්‍රවේශී ඔබගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමට කටයුතු කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය, පීඨාධිපතිවරුන්, අංශාධිපතිවරුන් හා ආචාර්ය මණ්ඩලය ඇතුලු අප සැමගේ ඒකායන බලාපොරොත්තුවයි.

පූජ්‍ය ආචාර්ය ඩී. ධම්මදස්සි හිමි
අධ්‍යක්ෂ - (cdce)
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2022.04.11

# පටුන


| | | |
|---|---|---|
| 1 | පාඨමාලාවලට අදාළ පීය, අධ්‍යයන අංශ හා දුරකථන අංක | 12 |
| 2 | බාහිර උපාධි පාඨමාලා | 14 |
| 3 | බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බලමණ්ඩල | 14 |
| 4 | බාහිර උපාධි පාඨමාලා ව්‍යුහය | 15 |
| 5 | ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් | 18 |
| 6 | වයස් සීමාව | 27 |
| 7 | භාෂා මාධ්‍යය | 27 |
| 8 | විභාග පටිපාටිය | 27 |
| 9 | උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය | 28 |
| 10 | ලියාපදිංචි අංකය | 32 |
| 11 | ලියාපදිංචිය දීර්ඝකිරීම | 33 |
| 12 | විෂයයන් වෙනස් කිරීම | 34 |
| 13 | අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම | 34 |
| 14 | ගාස්තු | 35 |
| 15 | අයදුම්පත් කැඳවීම | 37 |
| 16 | පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර | 38 |
| 17 | පරීක්ෂණ සඳහා පෙනී සිටීම | 39 |
| 18 | විභාග නීති හා අපේක්ෂකයන්ට උපදෙස් | 40 |
| 19 | විභාග අක්‍රමිකතා | 41 |
| 20 | විභාග ප්‍රතිඵල නිකුත් කිරීම | 42 |
| 21 | උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම | 42 |
| 22 | සහතිකපත් නිකුත් කිරීම | 42 |
| 23 | පරීක්ෂණ සඳහා අදාළ පැවරුම් | 44 |
| 24 | වෙනත් කරුණු | 44 |

## 1. පාඨමාලාවලට අදාළ පීඨ, අධ්‍යයන අංශ හා දුරකථන අංක

### 1.1 මානවශාස්ත්‍ර පීඨය

| මානවශාස්ත්‍ර පීඨය | සෘජු දුරකථන අංකය | දිගු දුරකථන අංක |
|---|---|---|
| පීඨාධිපති | 0112911913 | 700 |
| පීඨ කාර්යාලය | 0112914484 | 702/703/704/705 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 0112914484 | 701 |
| ඉංග්‍රීසි අධ්‍යයන අංශය | 0112903759 | 759 |
| නූතන භාෂා අධ්‍යයන අංශය | 0112903721 | 721 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | 0112903731 | 731 |
| බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය | 0112903717 | 717 |
| ලලිතකලා අධ්‍යයන අංශය | 0112903772 | 772 |
| වාග් විද්‍යා අධ්‍යයන අංශය | 0112908786 | 671/672 |
| සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය | 0112987101 | 663 |
| සිංහල අධ්‍යයන අංශය | 0112903681 | 681/682 |
| හින්දි අධ්‍යයන අංශය | 0112903775 | 775 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | 0112987102 | 783 |

### 1.2 සමාජීය විද්‍යා පීඨය

| සමාජීය විද්‍යා පීඨය | සෘජු දුරකථන අංකය | දිගු දුරකථන අංක |
|---|---|---|
| පීඨාධිපති | 011 2911915 | 800 |
| පීඨ කාර්යාලය | 011 2908168 | 805/808 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 0112908168 | 801 |
| ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය | 011 2914488 | 827/5040 |
| දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය | 0112903833 | 833 |
| ජාත්‍යන්තර අධ්‍යයන අංශය | 0112903830 | 830 |
| සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය | 0112903820 | 820 |
| ඉතිහාස අධ්‍යයන අංශය | 0112903841 | 841 |
| ජනසන්නිවේදන අධ්‍යයන අංශය | 0112903862 | 862 |
| දර්ශන අධ්‍යයන අංශය | 0112903871 | 871 |
| පුරාවිද්‍යා අධ්‍යයන අංශය | 011 2903891 | 891 |
| පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය | 0112903901 | 901 |
| භූගෝල විද්‍යා අධ්‍යයන අංශය | 0112903920 | 920 |
| සමාජ විද්‍යා අධ්‍යයන අංශය | 0112903939 | 939 |

| | | |
|---|---|---|
| ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණ අධ්‍යයන අංශය | 0112903941 | 941 |

1.3 වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

| **වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය** | **සෘජු දුරකථන අංකය** | **දිගු දුරකථන අංක** |
|---|---|---|
| පීඨාධිපති | 112917708 | 500 |
| පීඨ කාර්යාලය | 0112903501 | 502/503/504 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 0112903501 | 501 |
| ගණකාධිකරණ අධ්‍යයන අංශය | 011 2903551 | 551 |
| මූල්‍ය අධ්‍යයන අංශය | 0112903554 | 554 |
| මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය | 0112914483 | 602 |
| වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය | 0112903578 | 578 |
| අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය | 0112903624 | 624 |

1.4 විද්‍යා පීඨය

| **විද්‍යා පීඨය** | **සෘජු දුරකථන අංකය** | **දිගු දුරකථන අංක** |
|---|---|---|
| පීඨාධිපති | 0112903200 | 200 |
| පීඨ කාර්යාලය | 0112903202 | 202/203 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 0112903201 | 201 |
| ගණිත අංශය | 0112987106 | 301 |
| සංඛ්‍යා හා පරිගණක විද්‍යා අංශය | 0112903371 | 371 |

1.5 වෛද්‍ය පීඨය

| **වෛද්‍ය පීඨය** | **සෘජු දුරකථන අංකය** | **දිගු දුරකථන අංක** |
|---|---|---|
| පීඨාධිපති | 0112955283 | 113 |
| පීඨ කාර්යාලය | 0112955280 | 110 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 0112955280 | 112 |

## 02. බාහිර උපාධි පාඨමාලා

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර, සමාජයීය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන සහ විද්‍යා පීඨවලට අදාළව බාහිර උපාධි පාඨමාලා ක්‍රියාත්මක වේ. 1993 වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) සහ වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවන්ගෙන් පමණක් ඇරඹි මෙම ශාස්ත්‍රීය සේවාව 1999 වර්ෂයේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය සහ විද්‍යාවේදී සාමාන්‍ය උපාධි පාඨමාලා දක්වා ව්‍යාප්ත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු යොදන ලදී. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී වෘත්තීය චිකිත්සාව සාමාන්‍ය (බාහිර) උපාධිය**
**ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධිය**

උක්ත පාඨමාලා සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියලු කටයුතු අදාළ විධි විධානවලට යටත්ව පවත්වාගෙන යාම සිදුකරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය විසිනි. එහෙත් 2006 මාර්තු මස 01 දින දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය ආරම්භ වීමත් සමඟ එතෙක් බාහිර විභාග අංශය මඟින් ඉටුකළ සියලු කාර්යයන් පිළිබඳ සම්පූර්ණ වගකීම දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය වෙත පවරා දෙනු ලැබීය.

## 03. බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බල මණ්ඩල

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලු අධ්‍යයන සහ පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සම්බන්ධව කටයුතු කිරීමේ සියලු බලතල පහත සඳහන් බල මණ්ඩල වෙත පැවරී ඇත.

පාලක සභාව
සනාතන සභාව
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව

ප්‍රවේශ කමිටුව

විභාග පරීක්ෂක මණ්ඩල

අභියාචනා කමිටුව

විභාග අක්‍රමිකතා කමිටුව

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය

පීඨ සභා

අධ්‍යයන අංශ

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයට අදාළ උපාධි කටයුතු සම්බන්ධ සියලු නිර්දේශ අධ්‍යයන අංශ මට්ටමේ සිට ඉහළ මණ්ඩල වෙත ඉදිරිපත් කරනු ලබන අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණක් එම නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.

## 04. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධි පාඨමාලා ව්‍යුහය

කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි, විද්‍යාවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) සහ වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාවන් හැදෑරීම සඳහා ලියාපදිංචි වීම පිණිස ඒ ඒ පාඨමාලාවන්ට අදාළව මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලක සභාව විසින් අනුමත කරන ලද සුදුසුකම් ඇති අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ.

### 4.1 පාඨමාලා ඒකක ක්‍රමය

2007 වර්ෂයේ සිට කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම බාහිර උපාධි පාඨමාලා අභ්‍යන්තර පාඨමාලා ඒකක ක්‍රමයට සමගාමීව පවත්වාගෙන යනු ලැබේ. මේ යටතේ සාමාන්‍ය උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90ක් (Credits) සහ විශේෂ උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 120 ක් (Credits) ද ලබාගත යුතු වේ. කෙසේ නමුත් අදාළ පරීක්ෂණ තවදුරටත් වර්ෂාවසානයේ දී පමණක් පැවැත්වෙන අතර, පාඨමාලා ව්‍යුහයෙහි ඇතිවන වෙනස්කම් පිළිබඳව අදාළ අවස්ථාවල දී විද්‍යාර්ථීන් වෙත දන්වනු ඇත.

මෙම ක්‍රමය යටතේ ඒ ඒ විෂය ඒකක හැඳින්වීම සඳහා වෙන වෙන ම සංකේත නාමයන් යොදා ඇත. මෙහි දී ඒ ඒ විෂයයන් හැඳින්වීම සඳහා ඉංග්‍රීසි අකුරු හතරක් හා තවත් ඒකක හතරකින් යුතු අංකයක් භාවිත කර ඇත.

උදා:- SINHALA - SINH 18214

| Subject | Year | Semester | Subject No | Credit value |
|---|---|---|---|---|
| SINH | 1 | 8 | 21 | 4 |

- **වැඩි විස්තර සඳහා විභාග නිර්ණායක බලන්න.**

## 4.2 **ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව**

### 4.2.1 **ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලා සඳහා නිර්දේශිත විෂයයන්**

**මානව ශාස්ත්‍ර විෂයයන්**

| **Code** | **Subject** | **විෂයයන්** |
|---|---|---|
| LING | Linguistic | වාග් විද්‍යාව |
| IMAT | Image Arts | ප්‍රතිබිම්බ කලා |
| DMAT | Drama & Theatre | නාට්‍ය හා රංගකලාව |
| VIAD | Visual Arts | දෘෂ්‍ය කලා සහ සැලසුම් |
| PART | Performing Arts (Music) | ප්‍රාසංගික කලා සංගීතය |
| PART | Performing Arts (Dancing) | ප්‍රාසංගික කලා නර්තතන |
| SANS | Sanskrit | සංස්කෘත |
| BUCU | Buddhist Culture | බෞද්ධ සංස්කෘතිය |
| CHCU | Christinan Culture | ක්‍රිස්තියානි සංස්කෘතිය |
| FREN | French | ප්‍රංශ |
| JAPN | Japanese | ජපන් |
| GERN | German | ජර්මන් |
| RUSS | Russian | රුසියන් |
| ENGL | English | ඉංග්‍රීසි |
| SINH | Sinhala | සිංහල |
| BUPH | Buddhist Philosophy | බෞද්ධ දර්ශනය |
| BUPS | Buddhist Psycology | බෞද්ධ මනෝවිද්‍යාව |
| LTCR | Literary Criticism | සාහිත්‍ය විචාරය |
| VAST | Vasthu Shastra | වාස්තු ශාස්ත්‍ර |
| PALI | Pali | පාලි |
| HIND | Hindi | හින්දි |

**සමාජීය විද්‍යා විෂයයන්**

| Code | Subject | විෂයයන් |
|---|---|---|
| GEOG | Geography | භූගෝල විද්‍යාව |
| ANTH | Anthropolagy | මානව විද්‍යාව |
| PHIL | Philosophy | දර්ශනය |
| SOST | Social Statistics | සමාජ සංඛ්‍යානය |
| ECON | Ecomamics | ආර්ථික විද්‍යාව |
| ARCH | Archaeology | පුරා විද්‍යාව |
| PHIL | Philosophy | දර්ශනය |
| POLS | Political Science | දේශපාලන විද්‍යාව |
| SOCI | Sociology | සමාජ විද්‍යාව |
| MACO | Mass Communication | ජනසන්නිවේදනය |

### 4.2.2 විෂයයන් තෝරා ගැනීම

ශාස්ත්‍රවේදි උපාධි විෂයයන් තෝරා ගැනීම සඳහා ප්‍රවේශ නිර්නායකය බලන්න.

### 4.3 ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා අදාළ පාඨමාලා ඒකක වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් නිර්දේශ කොට ඇති අතර, අපේක්ෂකයන් විසින් එම නිර්දේශිත විෂයයන් සියල්ල හැදෑරිය යුතු වේ. උක්ත පාඨමාලාව සඳහා ලියාපදිංචි කරගන්නා අපේක්ෂකයන් වෙත අදාළ විෂයයමාලා පිළිබඳ සියලු විස්තර ලබා දීමට කටයුතු යොදා ඇත.

### 4.4 වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාව

වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාව සඳහා නිශ්චිත විෂය මාලා නිර්දේශ කොට ඇති අතර, අපේක්ෂකයන් විසින් එම විෂයයන් සියල්ල හැදෑරිය යුතු වේ. පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගන්නා අපේක්ෂකයන් වෙත අදාළ විෂය නිර්දේශ පිළිබඳ සම්පූර්ණ විස්තර ලබා දීමට කටයුතු යොදා ඇත.

### 4.5 විද්‍යාවේදි සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

විද්‍යාවේදි සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා නිශ්චිත විෂය මාලා නිර්දේශ කොට ඇති අතර, අපේක්ෂකයන් විසින් එම විෂයයන් සියල්ල හැදෑරිය යුතු වේ. පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගන්නා අපේක්ෂකයන් වෙත අදාළ විෂය නිර්දේශ පිළිබඳ සම්පූර්ණ විස්තර ලබා දීමට කටයුතු යොදා ඇත.

## 5. ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

එක් එක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳ සියලු විස්තර මතු දැක්වෙන අතර, අදාළ සුදුසුකම් සපුරා නොමැති කිසිම අපේක්ෂකයෙකු ලියාපදිංචි වීම සඳහා අයදුම් නොකළ යුතුය.

**වැදගත්**

මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශවලට සම්බන්ධ සේවයේ නියුතු අයෙකු අදාළ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට අයදුම් කරන අවස්ථාවලදී ඔහු/ඇය සේවය කරන දෙපාර්තමේන්තුවලට සම්බන්ධ විෂයයන් තෝරා නොගන්නා බවට ප්‍රකාශයක් අදාළ අංශ ප්‍රධානගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

### 5.1. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර) පාඨමාලාව

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා ලියාපදිංචි විය යුතු අතර, ඒ සඳහා මතු දැක්වෙන අවශ්‍යතාවන්ගෙන් එකක් හෝ සම්පූර්ණ කර තිබීම අත්‍යවශ්‍ය වේ.

ඒ ඒ විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණක් ලියාපදිංචි කර ගන්නා බැවින් අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ දී ඉහළ ම z ලකුණු ලබා ඇති අයට ප්‍රමුඛතාව ලබා දීමේ පදනම මත අදාළ අපේක්ෂකයන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ ප්‍රතිඵල මත හැරුණුවිට අදාළ වෙනත් පිළිගත් සුදුසුකම් මත ද ඉතා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගනු ලැබේ. **(ප්‍රවේශ නිර්ණායක බලන්න)**

5.1.1 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ දැක්වෙන යෝග්‍යතා මට්ටම් තුන, විශ්වවිද්‍යාල මට්ටම් එක සඳහා අවශ්‍ය ශ්‍රී ලංකා යෝග්‍යතා මට්ටම් දෙකට අදාළ (SLQF Level – 02) සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ට (NVQ Level – 5, Advanced Certificate) ලියාපදිංචිවීමට අයදුම් කළ හැකිය.

5.1.2 2016 අධ්‍යයන වර්ෂයේ සිට ඒ ඒ අධ්‍යයන වර්ෂවලට අදාළ බාහිර විභාග පාඨමාලා සඳහා ප්‍රවේශ කමිටුවේ නිර්දේශ මත සනාතන සභාව අනුමත කළ වෙනත් සුදුසුකම් වලින් ලියාපදිංචිවීමට අයදුම් කළ හැකිය.

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් අනුමත කොට ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණකර ඇති සිසුන්ට ද අපේක්ෂිත උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිවීමට අයදුම් කළ හැකිය.

i. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමිතියේ ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
ii. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
iii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
iv. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතික පත්‍රය හෝ අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු ඩිප්ලෝමා සහතිකය
v. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.
vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
vii. සේවක අධ්‍යාපන ආයතනයේ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
viii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.
ix. පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම.
x. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව හෝ සමත්ව තිබීම.
xi. පෙර තිබූ කනිෂ්ඨ විශ්වවිද්‍යාල මගින් හෝ පිළිගත් බහු තාක්ෂණික ආයතනයක් මගින් හෝ පිරිනමන ලද ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය.
xii. ශ්‍රී ලංකා යුද්ධ,නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරිලත් නිලධාරියෙකු වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.
xiii. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන පන්තියට බඳවා ගැනීමේ සීමිත විභාගයෙන් සමත් වී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී සිටින නිලධාරියෙකු වීම.

xiv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු ජාතික සහතිකය.

xv. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බුද්ධධර්මය පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

xvi. කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය ඩිප්ලෝමාව සමත්වීම.

xvii. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම.

xviii. අම්පාර හාඩි කාර්මික විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

xix. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ අධ්‍යයන පදනම් පාඨමාලාව සමත් වීම.

xx. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍ර පරීක්ෂණයෙන් සමත් වීම.

xxi. ඇක්වයිනාස් කෘෂිකාර්මික ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

xxii. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් නිකුත් කරනු ලබන පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත් වීම.

- Diploma in Computer System Design (English Medium)
- Higher Diploma in Computer Based Information System (English Medium)
- Diploma in Business Management (Sinhala /English Medium)
- Advance Diploma in Industrial Engineering (English Medium)
- Diploma in Marketing Management (English Medium)
- Diploma in Human ResourceManagement (Sinhala /English Medium)

xxiii. ගණකාධිකාරී ශිල්පීන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවේ අදියර තුනෙන් ම සමත්ව ලබා ගන්නා ඩිප්ලෝමා සහතිකය

xxiv. කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන ඩිප්ලෝමාව සමත් වීම.

xxv. ලන්ඩන් උසස් පෙළ පරීක්ෂණයෙන් සමත් වීම.

xxvi. දඹුල්ල, පැල්වෙහෙර, කුලියාපිටිය, කාර්මික විද්‍යාලයීය කෘෂිකර්ම ඩිප්ලෝමාව සමත් වීම.

xxvii. කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමාවක් සමත් වීම.

- ඉතිහාසය ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය

- වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- සිංහල ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- මනෝ විද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- පුරා විද්‍යා උරුමය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- කොරියන් භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- ප්‍රංශ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- හින්දි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය
- මහජන හා මාධ්‍ය සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව- කැලණිය විශ්වවිද්‍යාලය

**5.2 ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය.**

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් මතු දැක්වෙන සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ.

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් අනුමත විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම. (මේ අවශ්‍යතා සමඟින් 5.1 (අ) යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ.) ලියාපදිංචි වීමේ දී වාණිජ විෂය ධාරාව යටතේ අනුමත විෂයයන් හදාරා ඇති අයට ප්‍රමුඛතාව හිමිවේ.

(ආ) ඉහත 5.1 (අ) යටතේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ නොකරන එහෙත් කැලණිය විශ්වවිද්‍යාලය මගින් අනුමත කොට ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා ඇති අයට ද ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

i. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වෘත්තීය පිළිබඳ විශේෂ ගුරු සහතිකය.

ii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම. (ප්‍රථම හා ද්විතීය වර්ෂ පරීක්ෂණ)

iii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම. (ප්‍රථම හා ද්විතීය වර්ෂ පරීක්ෂණ)

iv. ලන්ඩනයේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරීත්ව ආයතනයෙන් හෝ සහතිකලත් සහ සංස්ථාපිත ගණකාධිවරුන්ගේ සංගමයෙන් පවත්වන I, II, III, පරීක්ෂණවලින් සාමාර්ථ්‍යය ලබා තිබීම.

v. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

vi. ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

vii. ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

viii. ලන්ඩන් බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

ix. පෙර තිබූ කනිෂ්ඨ විශ්වවිද්‍යාල මගින් හෝ පිළිගත් බහු තාක්ෂණික ආයතනයක් මඟින් හෝ පිරිනමන ලද ව්‍යාපාර අධ්‍යයනය පිළිබද ඩිප්ලෝමාව.

x. ශ්‍රී ලංකා යුද්ධ,නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරිලත් නිලධාරියෙකු වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

xi. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 වන පන්තියට බඳවා ගැනීමේ සීමිත විභාගයෙන් සමත් වී, ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී සිටින නිලධාරියෙකු වීම.

xii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන පිළිබද සහතිකය.

xiii. එක්සත් රාජධානියේ සමාගම් සහ වාණිජ්‍යමය ගණකාධිකාරිවරුන්ගේ සමාජයේ සාමාජිකත්වය.

xiv. එංගලන්තයේ වැඩ අධ්‍යයන අභ්‍යාසලාභින්ගේ ආයතනයේ ඩිප්ලෝමාව.

xv. බ්‍රිතාන්‍යයේ කළමණාකාරිත්වය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය

xvi. ලන්ඩනයේ පරිපාලන ගණකාධිකාරිත්වය පිළිබඳ ආයතනයේ පරීක්ෂණයේ සියලුම කොටස්වලින් සමත් වී තිබීම.

xvii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ අධ්‍යාපන අමාත්‍යංශයේ බහුතාක්ෂණික ආයතනයේ පොත් තබන්නාගේ උසස් වාණිජ සහතිකය ලබා තිබීම.

xviii. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරිත්වයේ අවසාන පරීක්ෂණය සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී තිබීම.

xix. රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් වශයෙන් බඳවා ගැනීම පිණිස විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වී එම සේවයට ඇතුළත් වී ඇති නිලධාරියෙකු වීම.

xx. ලන්ඩන් වාණිජ මණ්ඩලයේ පොත් තැබීම පිළිබඳ උසස් සහතිකය.

xxi. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

xxii. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකත්වය.

xxiii. පහත සඳහන් කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත් වීම.

- අලෙවිකරණ ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර මුල්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර ගිණුම්කරණය ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- මානව සම්පත් කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය

xxiv. රජයේ හෝ පෞද්ගලික ආයතනයක විධායක මට්ටමේ කළමනාකරණ පළපුරුද්ද.

මීට අමතරව කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය සහ සනාතන සභාව මඟින් අනුමත කරන වෙනත් සුදුසුකම් ඇති අයට අදාළ පාඨමාලාව සඳහා අයදුම්කිරීමට ඉඩ සලසා ඇති අතර, ඒ පිළිබඳ සනාතන සභා තීරණය අවසන් තීරණය වේ.

### 5.3 වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය (බාහිර)

වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් ඒ සඳහා ලියාපදිංචි වීම පිණිස මතු දැක්වෙන අවශ්‍යතාවන්ගෙන් එකක් හෝ සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ.

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් අනුමත විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම. (මේ අවශ්‍යතා සමඟින් 5.1 (අ) යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ). ලියාපදිංචි වීමේ දී වාණිජ විෂය ධාරාව යටතේ අනුමත විෂයයන් හදාරා ඇති අයට ප්‍රමුඛතාව හිමිවේ.

(ආ) ඉහත 5.3 (අ) යටතේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ නොකරන එහෙත් කැලණිය විශ්වවිද්‍යාලය මගින් අනුමත කොට ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා ඇති අයට ද වාණිජවිද්‍යා පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

- මෙහි I වන පරිශිෂ්ටයේ දැක්වෙන පරිදි වාණිජ විද්‍යාවේදී උපාධියට අදාළ පරීක්ෂණය සඳහා බාහිර අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වීම පිණිස කැලණිය විශ්වවිද්‍යාලය මගින් පිළිගෙන ඇති සුදුසුකම් අතුරින් එකක් ලබා තිබීම.
- පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම. (මෙම II පරිශිෂ්ටය බලන්න).
- මීට අමතරව ඉහත සඳහන් සුදුසුකම් හෝ අවශ්‍යතාවන්ට සමාන යැයි කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය සහ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ඇති අයට ද අදාළ පාඨමාලාව සඳහා අයදුම් කළ හැකි අතර, ඒ පිළිබඳව සනාතන සභා තීරණය අවසන් තීරණය වේ.

### 5.3.1 I පරිශිෂ්ටය

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධියට අදාළ පරීක්ෂණ සඳහා බාහිර අපේක්ෂකයන් වශයෙන් ලියාපදිංචි කිරීම පිණිස විශ්වවිද්‍යාලය පිළිගත් වෘත්තීය හා වෙනත් සුදුසුකම්.

i. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වෘත්තීය විශේෂ ගුරු සහතිකය. ප්‍රථම සහ ද්විතීය වර්ෂ පරීක්ෂණවලින් සමත් ව තිබීම.(II වන පරිශිෂ්ටය බලන්න.)

ii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ සහ ද්විතීය පරීක්ෂණවලින් සමත් ව තිබීම. (II වන පරිශිෂ්ටය බලන්න.)

iii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ සහ ද්විතීය පරීක්ෂණවලින් සමත් ව තිබීම.(II වන පරිශිෂ්ටය බලන්න.)

iv. ලන්ඩනයේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයෙන් හෝ සහතිකලත් සහ සංස්ථාපිත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙන් පවත්වන ලද 1,11 සහ 111 වැනි පරීක්ෂණවලින් සාමර්ථ්‍යය ලබා තිබීම.

(II වන පරිශිෂ්ටය බලන්න)

v. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම.(II වන පරිශිෂ්ටය බලන්න)

vi. ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

vii. පෙර තිබූ කනිෂ්ඨ විශ්වවිද්‍යාලය මඟින් හෝ බහු තාක්ෂණික ආයතනයක් මඟින් හෝ පිරිනමන ලද ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව.

viii. ශ්‍රී ලංකා යුද්ධ නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරීලත් නිලධාරියෙකු වශයෙන් වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ix. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන පන්තියට බඳවා ගැනීමේ සීමිත විභාගයෙන් සමත් වී, ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී සිටින නිලධාරියකු වීම.

x. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු ජාතික සහතිකය.

xi. එක්සත් රාජධානියේ සමාගම් සහ වාණිජමය ගණකාධිකාරිවරුන්ගේ සමාජයේ සාමාජිකත්වය.

xii. එංගලන්තයේ වැඩ අධ්‍යයන අභ්‍යාසලාභීන්ගේ ආයතනයේ ඩිප්ලෝමාව (Institute of Work Study Practitioners, England)

xiii. බ්‍රිතාන්‍යයේ කළමනාකාරිත්වය පිළිබද ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

xiv. ලන්ඩනයේ පරිපාලන ගණකාධිකාරීත්වය පිළිබද ආයතනයේ (Instituteof Administrative Accounting, London)පරීක්ෂණයෙන් සියලු ම කොටස්වලින් සමත්ව තිබීම.

xv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ බහු තාක්ෂණ ආයතනයේ පොත් තබන්නාගේ උසස් වාණිජ සහතිකය ලබා තිබීම.

xvi. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීන්ගේ අවසාන පරීක්ෂණය සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී සිටීම.

xvii. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ කළමනාකරණ සේවා නිලධාරින් වශයෙන් බඳවා ගැනීම පිණිස විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වී එම සේවයට ඇතුළත් වී ඇති නිලධාරියෙකු වීම.

xviii. ලන්ඩන් වාණිජ මණ්ඩලයේ පොත් තැබීම පිළිබඳ උසස් සහතිකය.

xix. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් සහතිකය ලබා තිබීම.

xx. පහත සඳහන් කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත් වීම.

- අලෙවිකරණ ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාල
- ව්‍යාපාර ගිණුම්කරණය ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- මානව සම්පත් කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර ඩිප්ලෝමා පාඨමාලාව - කැලණිය විශ්වවිද්‍යාලය

### 5.4 විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

මෙම පාඨමාලාව යටතේ යෝජිත විෂය සංකලන දෙක සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මතු දැක්වේ.

(අ) විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස.(උසස් පෙළ) පරීක්ෂණයෙන් විද්‍යා විෂය ධාරාව යටතේ අනුමත විෂයයන් අතුරින් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය/ උසස් ගණිතය සහ වෙනත් විෂය උපරිම වශයෙන් දෙකක් සමඟ විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම
(මේ අවශ්‍යතා සමගින් 5.1 (අ) යටතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වේ).

හෝ

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කළ හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම හෝ අවශ්‍ය වේ.

## 6. වයස් සීමාව

බාහිර උපාධි සඳහා අදාළ ලියාපදිංචි වීමට වයස අවු. 18 ට වැඩි අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

## 7. භාෂා මාධ්‍යය

බාහිර උපාධි සඳහා අදාළ සියලුම පරීක්ෂණ දැනට සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## 8. විභාග පටිපාටිය

කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලාවන් සඳහා අදාළ පරීක්ෂණ ඒ ඒ අධ්‍යයන වර්ෂ අවසානයේ දී පැවැත්වීමට විධි විධාන යොදා ඇත. මුල් ලියාපදිංචියේ සිට වසරක කාලයක් ගතවීමෙන් පසුව ඒ ඒ පාඨමාලාවන්ට අදාළ ප්‍රථම පරීක්ෂණවලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතු ය. අනතුරුව එළඹෙන වර්ෂවල දී ද්විතීය සහ තෘතීය පරීක්ෂණ සඳහා පිළිවෙළින් පෙනී සිටිය හැකි වේ. එසේ ම අනතුරුව එළඹෙන වර්ෂවල දී පූර්ව වර්ෂවල අසමත්වන හෝ ඌන සාමර්ථයන් ලබන විෂයයන් සඳහා නැවත පෙනී සිටීමට ද අපෙක්ෂකයින්ට අවසර දෙනු ලැබේ.

එහෙත් සෑම ලියාපදිංචි අපේක්ෂකයෙකු විසින් ම එළඹෙන සෑම වර්ෂයක් සඳහා ම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට වග බලා ගත යුතු අතර, එසේ ලියාපදිංචිය දීර්ඝ කරවා ගත හැකි උපරිම කාලය අවසන් වීමට පෙර තම උපාධි පාඨමාලාව අවසන් කර ගැනීමට ද වග බලා ගත යුතු වේ.

### 8.1 විභාග පැවැත්වෙන ක්‍රම වේදය

කැලණිය විශ්වවිද්‍යාලය තීරණය කරණ පරිදි විද්‍යාර්ථීන් විභාග ශාලාවලට කැඳවා හෝ මාර්ග ගත ක්‍රමයට විභාග පැවත්වීම සිදු කරනු ලැබේ.

### 8.2 පාඨමාලා ඒකක ඇගයීම

සෑම පාඨමාලා ඒකකයක් ම ඇගයීමට ලක් කර ශ්‍රේණි ප්‍රදාන කෙරේ. පාඨමාලා ඒකක ඇගයීම පහත සඳහන් ක්‍රමවලින් එකකට හෝ කිහිපයකට හෝ අනුව සිදුවිය හැක.

| | |
|---|---|
| 8.2.1 | ලිඛිත විභාග (Examination) |
| 8.2.2 | මූලාශ්‍රය පරිශීලන විභාග (Open Book Examination) |
| 8.2.3 | වාර්තා (Reports) |
| 8.2.4 | වාචික පරීක්ෂණ (Oral Test) |
| 8.2.5 | අඛණ්ඩ ඇගයීම් (Continuous Assessment) |
| 8.2.6 | පැවරුම් (Assignment) |
| 8.2.7 | මාර්ග ගත ප්‍රශ්නාවලි (Online Quizzes) |
| 8.2.8 | පන්ති කාමර පරීක්ෂණ (In class Test) |
| 8.2.9 | ප්‍රස්තුතිකරණ (Presentation) |
| 8.2.10 | ආයතනික පුහුණුව (Internship/ Work-Based training) |

## 9. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය

අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 5ක් ඇතුළත උපාධිය සම්පූර්ණ කළ යුතු අතර පන්ති සාමාර්ථ ලබා ගැනීමේ දී එය අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3ක් විය යුතුය. එසේ වුව ද අධ්‍යයන වර්ෂ 10ක උපරිමයකට යටත්ව අසමත් පාඨමාලා ඒකක සම්පූර්ණ කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.

### 9.1 එක් විෂයක් සඳහා ලියාපදිංචිය ලබා දෙන උපරිම සීමාව හා අවම සීමාව

අධ්‍යන වර්ෂයට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25% ක උපරිමයකට යටත්ව එක් විෂයක් සඳහා ලියාපදිංචිය ලබා දෙන අතර අවම වශයෙන් අයදුම්කරුවන් 20 දෙනෙකුවත් නොමැති විෂයයන් සඳහා ලියාපදිංචි සිදු කරනු නොලැබේ. එබැවින් මෙම හේතුව නිසා ලියාපදිංචිය ප්‍රතික්ෂේප වන අයදුම්කරුවන්ට වෙනම විෂයන් ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

### 9.2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අපේක්ෂකයෙකු ලියාපදිංචි වී අවම වශයෙන් අධ්‍යයන වර්ෂ තුනක (03) කාලයක් ගත කළ යුතු ය. ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂයක් සම්පූර්ණ කළ පසු ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අතර අනතුරුව එළඹෙන වර්ෂවල දී ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)උපාධි ද්විතීය හා තෘතීය පරීක්ෂණවලට පිළිවෙළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කළ හැකි ය.

**9.3 ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)**

ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය සඳහා අපේක්ෂකයෙකු ගත කළ යුතු අවම කාලය අධ්‍යයන වර්ෂ තුනකි. ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂයක් සම්පූර්ණ වූ පසු ව්‍යාපාර කළමනාකරණවේදී ප්‍රථම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අතර, අනතුරුව එළඹෙන වර්ෂවල දී ව්‍යාපාර කළමනාකරණවේදී ද්විතීය සහ තෘතීය පරීක්ෂණ සඳහා පිළිවෙළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කළ හැකි ය.

**9.4 වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය (බාහිර)**

වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය (බාහිර) සම්පූර්ණ කර ගැනීම සඳහා අපේක්ෂකයෙකු ගත කළ යුතු අවම කාල සීමාව අධ්‍යයන වර්ෂ හතරකි. ප්‍රථම, දෙවන, තෙවන, හතරවන, පරීක්‍ෂණ සඳහා වර්ෂ හතරක දී පිළිවෙළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කර ගත හැකි ය.

**9.5. පරීක්ෂණ**

අපේක්ෂකයන්ගේ පහසුව සඳහා ඒ ඒ උපාධි පාඨමාලාවලට අදාළ පරීක්ෂණ වෙන් වශයෙන් පහත දැක් වේ.

**9.5.1. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය** (බාහිර)

- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) ප්‍රථම පරීක්ෂණය
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) දෙවන පරීක්ෂණය
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) තෙවන පරීක්ෂණය

**9.5.2. ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)**

- ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) ප්‍රථම පරීක්ෂණය
- ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) දෙවන පරීක්ෂණය
- ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) තෙවන පරීක්ෂණය

**9.5.3. වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය (බාහිර)**

- වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) ප්‍රථම පරීක්ෂණය
- වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) දෙවන පරීක්ෂණය

- වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) තෙවන පරීක්ෂණය
- වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) සිව්වන පරීක්ෂණය

**9.5.4. විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)**

- විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) ප්‍රථම පරීක්ෂණය
- විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) දෙවන පරීක්ෂණය
- විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) තෙවන පරීක්ෂණය

## 9.6 ප්‍රතිඵල නිර්ණය කිරීම

### 9.6.1. පරීක්ෂණ සාමාර්ථ්‍යය

(අ). බාහිර උපාධි පාඨමාලාවලට සම්බන්ධ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකු ම එක ම වතාවක දී අදාළ පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූලව ඒ ඒ පරීක්ෂණවලට අදාළ ව තමන් පෙනී සිටි සියලු ම විෂයයන් හෝ පාඨමාලා ඒකකවලට අදාළ ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා සමත්වීමට සුදුසු මට්ටමක සිටින බව පරීක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් එකී අපේක්ෂකයන් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

(ආ). කිසියම් පරීක්ෂණයකට අදාළ විෂයයකින්/පාඨමාලා ඒකකයකින් ඌන සාමර්ථය/ප්‍රතිඌන සාමර්ථ්‍යය ලබා ඇති අපේක්ෂකයෙකු එකී ඌනතා සම්පූර්ණ කිරීමෙන් පසු ව පමණක් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

### 9.6.2. ඌන සාමාර්ථ්‍යය

කිසියම් පරීක්ෂණයක දී අදාළ නිර්ණායකවලට අනුව එම පරීක්ෂණවලින් සමත්වීම සඳහා අවශ්‍ය ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ලබා නොගන්නා එහෙත් නිර්දේශිත විෂය ඒකක සංඛ්‍යාවකට පමණක් සාමර්ථ්‍යය සඳහා අදාළ ලකුණු සාමාන්‍යය ලබා ඇති අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් ඌන සාමර්ථ්‍යය ලැබූ අය ලෙස සැලකේ.

**9.6.3. අසමත්වීම**

අදාළ පරීක්ෂණවලින් සමත් වීමට හෝ ඌන සාමර්ථ්‍යයක් ලැබීමට හෝ අදාළ අවශ්‍යතා සම්පූර්ණ නොකරන සියලු අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් අසමත් වූ අය සේ සැලකේ.

**9.6.4. ඌනතා සම්පූර්ණ කිරීම**

අවසාන උපාධි පරීක්ෂණවලට ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකුම ඊට ප්‍රථමයෙන් හෝ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් වන වර්ෂයේ ම හෝ තම උපාධි පාඨමාලාවට අදාළ පූර්ව පරීක්ෂණවල ඌනතාවන් ඇතොත් ඒ සියල්ල සම්පූර්ණ කර තිබීම අත්‍යවශ්‍ය වේ. තවද, අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට සාමාන්‍ය / විශේෂ උපාධියක් නම්, අනතුරුව එළඹෙන වසර දෙක තුළ දී සිය ලියාපදිංචි කාලසීමාව අඛණ්ඩව පවත්වාගෙන යාමට යටත්ව හා පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූලව තම උපාධි පාඨමාලාවට අදාළ ඌනතා සියල්ල සම්පූර්ණ කළ යුතු වේ. නියමිත කාලසීමාවන් තුළ අදාළ ඌනතා සම්පූර්ණ නොකරන කිසිම අපේක්ෂකයෙකු වෙත උපාධිය ප්‍රදානය කිරීම සඳහා කටයුතු කරනු නොලැබේ.

**9.6.5. උපාධි සාමාර්ථය**

(අ). ඒ ඒ උපාධි පාඨමාලාවන් සඳහා නියමිත පරීක්ෂණ සියල්ලෙන් ම අදාළ රෙගුලාසිවලට අනුකූලව සියලු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අපේක්ෂකයන් අදාළ උපාධිය සමත් වූ ලෙස සලකනු ලැබේ.

(ආ). උපාධි ප්‍රදනය කිරීම ඒ ඒ පාඨමාලාවට අදාළ නිර්නායකයන්ට අනුකූලව මෙන් ම සනාතන සභාව විසින් අනුමත කර ඇති අතුරු නීති (BY LAWS) අනුව සිදුවේ.

**9.6.5.1. පන්ති සාමර්ථ්‍යය**

(අ). ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) සහ ශාස්ත්‍රවේදී/වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාවන්ට අදාළව පැවැත්වෙන පරීක්ෂණවලදී අදාළ නිර්ණායකවලට අනුකූලව සියලු අවශ්‍යතා සම්පූර්ණකරමින් විශේෂ කුසලතාවන් දක්වා ඇති අපේක්ෂකයන් වෙත පන්ති සාමර්ථ්‍යයන් පිරිනැමීම සඳහා සලකා බලනු ලැබේ.

(ආ), පන්ති සාමර්ථ්‍යයක් පිරිනැමීම සඳහා ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි අපේක්ෂකයෙකු ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත දී සහ ශාස්ත්‍රවේදී හෝ වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) අපේක්ෂකයෙකු ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ හතරක් (04) ඇතුළත දී අඛණ්ඩව පිළිවෙළින් අදාළ පරීක්ෂණ සඳහා පෙනී සිට ඒ ඒ පරීක්ෂණ සඳහා පෙනී සිටි ප්‍රථම අවස්ථාවේ දී ම අදාළ සියලු අවශ්‍යතා සම්පූර්ණ කොට තිබීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) කැලණිය විශ්වවිද්‍යාලය විසින් අනුමත විභාග පරිපාටිවලට සහ ඒ ඒ පරීක්ෂණවලට අදාළ විභාග නිර්ණායකවලට අනුකූල ව සියලු අවශ්‍යතා සම්පූර්ණ කරන අපේක්ෂකයන් වෙත ඔවුන් විසින් දක්වා ඇති කුසලතාවන් මත දෙවන පන්තිය (ඉහළ/පහළ) ගෞරව සාමර්ථ්‍යය හෝ ප්‍රථම පන්ති ගෞරව සාමර්ථ්‍යය හෝ පිරිනැමීම සඳහා සලකා බලනු ලැබේ.

## 10. ලියාපදිංචි අංකය

උපාධි පාඨමාලා සඳහා බාහිර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි කර ගනු ලබන සෑම ශිෂ්‍යයෙකු වෙත ම ලියාපදිංචි අංකයක් නිකුත් කරනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු බාහිර විභාග සම්බන්ධයෙන් කරනු ලබන සෑම විමසීමක දී ම තම ලියාපදිංචි අංකය සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

### 10.1. ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපිය සහ ශිෂ්‍ය හැඳුනුම්පත

ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන සෑම අයදුම්කරුවෙක් වෙත ම ඔහු/ඇය අදාළ බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලිපියක් (අදාළ විස්තර ඇතුළත් කොට) ද සමඟින් බාහිර ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ.

### 10.2. එක් එක් විෂයයක් සඳහා ලියාපදිංචිය ලබා දෙන උපරිම සීමාව හා අවම සීමාව

අධ්‍යයන වර්ශයට අනුමත ශිෂ්‍ය සංඛයාවෙන් 25 % ක උපරිමයකට යටත්ව එක් විෂයක් සඳහා ලියාපදිංචියට ලබා දෙන අතර  අවම වශයෙන් අයදුම් කරුවන් 20 දෙනකුවත් නොමැති විෂයන් සඳහා ලියාපදිංචිය සිදු කරනු නොලැබේ. එබැවින් මෙම හේතු නිසා ලියාපදිංචිය ප්‍රතික්ෂේප අයදුම් කරුවන්ට වෙනත් විෂයන් ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

## 10.3 ලියාපදිංචියක වලංගුතාව

ප්‍රථම ලියාපදිංචියෙන් පසුවද සෑම අධ්‍යයන වර්ෂයක් සඳහාම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට අපේක්ෂකයින් කටයුතු කළ යුතු වේ. එසේ ලියාපදිංචිය දීර්ඝ කරගත හැකි උපරිම කාලය උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම හෝ මුල් ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ හතක (07) කාලයක් සම්පූර්ණ වීම යන දෙකින් පළමුව එළඹෙන දිනෙන් අවසන් වේ. අභියාචනා මගින් වසර 10 දක්වා දිර්ඝ කරගත හැක.

## 11. ලියාපදිංචිය දීර්ඝ කිරීම

සිය ලියාපදිංචි කාලසීමාව ඉකුත්වී ඇති අපේක්ෂකයෙකුට කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එබැවින් තම ලියාපදිංචි කාලසීමාව ඉකුත්වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කිරීම අදාළ අපේක්ෂකයාගේ වගකීම වේ. පරීක්‍ෂණ සඳහා අයදුම් කරන අවස්ථාවලදී ලියාපදිංචිය දීර්ඝ කිරිම සම්බන්ධ උපදෙස් ලබාගත හැකිය. සෑම ලියාපදිංචියක් ම වසරක කාලයට පමණක් වලංගු වේ.

### 11.1. ලියාපදිංචිය අවලංගු කිරීම

(අ) ලියාපදිංචි බාහිර උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී සිය ලියාපදිංචිය අවලංගුකරවා ගත හැකිය.

<u>එවැනි අවස්ථාවක දී අදාළ ගාස්තු ආපසු ලබා දෙන ලෙස ඉල්ලීමට අපේක්ෂකයෙකුට අයිතියක් නොමැත.</u>

පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකුල ක්‍රියා මාර්ගයක් ගැනීමට නියමිතව ඇති අපේක්ෂකයෙකු විසින් ලියාපදිංචිය අවලංගුකරවා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සිය ලියාපදිංචි කාලසීමාව අවසන් වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකරන අපේක්ෂකයන්ගේ ලියාපදිංචිය ස්වයංක්‍රීයව ම අවලංගු වන අතර, එවැනි අයෙකු නැවත ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ලියාපදිංචි වීමේ පරිපාටියට අනුව නව අයදුම්පත්‍රයක් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

## 12. විෂයයන් වෙනස් කිරීම

### 12.1 ලියාපදිංචි විෂය හෝ භාෂා මාධ්‍ය සංශෝධනය කිරීම.

ලියාපදිංචි විෂයන් මාරු කිරීමට හෝ භාෂා මාධ්‍ය වෙනස් කිරීමට සෑම ආපේක්ෂකයෙකුට ම එක් අවස්ථාවක් ලැබෙන අතර එය ආයතනයේ ලියාපදිංචිය අවසන් වූ දිනයේ සිට මාසයක් ඇතුළත සිදුකර ගත යුතු වේ. ඉන් පසු කුමන හෝ හේතුවක් මත විෂය හෝ භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැක.

## 13. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම

### 13.1 අත් පත්‍රිකා/මාර්ගෝපදේශ ග්‍රන්ථ

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන අපේක්ෂකයන් සඳහා උපරිම පහසුකම් සලසා දීමට කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය මඟින් නිරන්තරයෙන් ම කටයුතු කරනු ලැබේ. ඒ අනුව සිය අධ්‍යයන කටයුතු ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා මෙන් ම අදාළ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමේ දී ඇතිවන ප්‍රායෝගික දුෂ්කරතා සම්බන්ධව ද විශ්වවිද්‍යාල මහාචාර්ය, ආචාර්ය භවතුන්ගේ උපදෙස් ලබාගැනීමේ අවස්ථාව සලසා දීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු වී ඇත. මීට අමතරව අදාළ පරීක්ෂණ සඳහා විවිධ විෂයයන්ට සහ පාඨමාලාවලට අදාළ LMS & Zoom **දේශන සහ** Zoom **සම්මන්ත්‍රණ ද හැඳින්විය හැක.** විස්තර පත්‍රිකා, සටහන්, අත්පොත් ආදිය සැපයීම කෙරෙහි ද දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි අවධානය යොමු වී ඇත.

### 13.2 උපාධි පරීක්ෂණ සඳහා සම්මන්ත්‍රණ

සියලුම උපාධි පරීක්ෂණවලට අදාළව සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා බාහිර විභාග අංශය මඟින් සියලු විධිවිධාන යොදනු ඇත. අදාළ සම්මන්ත්‍රණ දැනට සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන අතර, ඒ සඳහා වෙනම ගාස්තුවක් ලියාපදිංචි වන අවස්ථාවේ දී හෝ ලියාපදිංචිය දීර්ඝ කරන අවස්ථාවේ දී හෝ අයකරනු ලැබේ. එක් එක් පරීක්ෂණවලට අදාළ සම්මන්ත්‍රණ සඳහා වෙන වෙනම ගාස්තු ගෙවිය යුතු වේ. නියමිත ගාස්තු ගෙවා නැති කිසිදු අපේක්ෂකයෙකු වෙත සම්මන්ත්‍රණ/විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබේ.

13.3 මීට අමතරව අපේක්ෂකයින්හට ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය( LMS) මගින් අධ්‍යයන පහසුකම් ලබාදිමට කටයුතු කරනු ඇත

- උක්ත පහසුකම භාවිත කිරිම සඳහා අවශ්‍යවන පරිශිලක නාමය (Username) සහ අගුල් පදය (Password) කේන්ද්‍රය විසින් සිසුන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. මෙය වෙනත් පාර්ශවයන් වෙත පැවරීම දඩුවම් ලැබිය හැකි වරදක් වේ.

13.4 **පසුගිය ප්‍රශ්න පත්‍ර**

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පෙර වර්ෂවල පවත්වන ලද පරීක්ෂණවලට අදාළ ප්‍රශ්න පත්‍ර අපගේ වෙබ් අඩවිය මගින් බාගත (Download) කර ගත හැක.

එමෙන් ම පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සහ පාඩම් මාලා LMS (Learning Management System) මගින් ලබා ගැනීමේ හැකියාව පවතී.

14. **ගාස්තු**

| | |
|---|---|
| විස්තර සහ අයදුම්පත් ගාස්තු | රු. 1,000.00 |
| **පාඨමාලා ගාස්තු** | |
| ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව | රු. 86,000.00 |
| ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව | රු. 120,000.00 |
| වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාව | රු. 162,500.00 |
| විද්‍යාවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව | රු. 300,000.00 |

විද්‍යාර්ථීන්ගේ පහසුව සඳහා මෙම ගාස්තු වාරික මගින් ගෙවීමට අවස්ථාව සලසා ඇති අතර, එය පහත සඳහන් ආකාරයට දැක්විය හැකි ය.

| **ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව B.A. (General) - අවුරුදු 03** | |
|---|---|
| පළමු වන වසර | පළමුවන වාරිකය රු. 15,000.00<br>(ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතුය) |
| | දෙවන වාරිකය රු. 17,000.00<br>(පළමු වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| දෙවන වසර | තෙවන වාරිකය රු. 15,000.00<br>(පළමු වසර විභාගය අවසන් වී මාස දෙකකට පෙර ගෙවිය යුතුය) |
| | සිව්වන වාරිකය රු. 17,000.00<br>(දෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| තෙවන වසර | පස්වන වාරිකය රු. 22,000.00<br>(තෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |

| ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව B.B.Mgt (General) - අවුරුදු 03 | |
|---|---|
| පළමු වන වසර | පළමුවන වාරිකය රු. 25,000.00<br>(ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතුය) |
| | දෙවන වාරිකය රු. 20,000.00<br>(පළමු වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| දෙවන වසර | තෙවන වාරිකය රු. 25,000.00<br>(පළමු වසර විභාගය අවසන් වී මාස දෙකකට පෙර ගෙවිය යුතුය) |
| | සිව්වන වාරිකය රු.25,000.00<br>(දෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| තෙවන වසර | පස්වන වාරිකය රු. 25,000.00<br>(තෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |

| වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි (බාහිර) පාඨමාලාව B.Com(Special)-අවුරුදු 04 | |
|---|---|
| පළමු වන වසර | පළමු වන වාරිකය රු. 44,000.00<br>(ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතුය) |
| | දෙවන වාරිකය රු. 28,000.00<br>(පළමු වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| දෙවන වසර | තෙවන වාරිකය රු. 30,000.00<br>(දෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| තෙවන වසර | සිව්වන වාරිකය රු. 30,000.00<br>(තෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |
| සිව්වන වසර | පස්වන වාරිකය රු. 30,500.00<br>(සිව්වන වසර විභාගයට පෙර ගෙවිය යුතුය) |

**සැ.යු.**

දැනට විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති මුදල් කිසිදු හේතුවක් මත ආපසු නොගෙවන අතර, එය පහත පරිදි අදාළ වනු ඇත.

- ✓ ඉහත ගාස්තුවලට අමතරව එම විභාග සඳහා විශ්වවිද්‍යාලය විසින් නියම කරන ලබන විභාග ගාස්තුවක් ගෙවිය යුතුය.

**අමතර ගාස්තු**

| | |
|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (එක් වර්ෂයක් සඳහා) | රු. 1,500.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත (නැවත සකස් කිරීම සඳහා) | රු. 250.00 |
| විෂය නිර්දේශ පොත (ශාස්ත්‍රවේදී -අමතර පිටපත් සඳහා) | රු. 450.00 |
| විෂය නිර්දේශ පොත (වාණිජ විද්‍යාවේදී - අමතර පිටපත් සඳහා) | රු. 280.00 |
| විෂය නිර්දේශ පොත (ව්‍යාපාර කළමනාකරණවේදී - අමතර පිටපත් සඳහා) | රු. 280.00 |
| සපයා ඇති තොරතුරු වෙනස් කිරීම සඳහා | රු. 200.00 |
| ප්‍රායෝගික පරීක්ෂණ (එක් විෂයයකට/ඒකකයකට) | රු. 1,000.00 |
| සහතිකපත්‍ර ගාස්තු | රු. 200.00 |
| සහතිකපත්‍ර ගාස්තු (අමතර පිටපතක් සඳහා) | රු. 150.00 |
| විෂයයන් වෙනස් කිරීම සඳහා (ලියාපදිංචිය සිදු කිරීමෙන් පසුව) | රු. 300.00 |
| උපාධි ප්‍රදානෝත්සව ගාස්තු - (මුල් උපාධි සහතිකපත්‍ර ගාස්තු ඇතුළත්ව) | |
| උපස්ථිතියෙහි | රු. 3,500.00 |
| අනුපස්ථිතියෙහි | රු.3,000.00 |

**15. අයදුම්පත් කැඳවීම**

බාහිර උපාධි පාඨමාලාවලට ලියාපදිංචි වීමට සහ පරීක්ෂණ සඳහා පෙනී සිටීම පිණිස අයදුම්පත් කැඳවීම පුවත්පත් දැන්වීම් මඟින් සහ අන්තර්ජාලය මඟින් සිදුකරනු ලැබේ. ලියාපදිංචි වීම සහ පරීක්ෂණ සඳහා අයදුම්කිරීමේ දී ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය මඟින් Online ක්‍රමයට පමණක් සිදු කරනු ලැබේ. අදාළ අයදුම්පත් නියමිත කාල සීමාවේ දී ලබා ගැනීමට කටයුතු කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

### 15.1. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ ලිපි ලේඛන සමඟින් අයදුම් පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන උපාධිය/කාරණය පැහැදිලිව සඳහන් කොට පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
නො. 56/6
කෝන්ගහ වත්ත පාර
නුවර පාර
කිරිබත්ගොඩ

### 15.2. අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම.

පහත සඳහන් හේතුන් එකක් හෝ කිහිපයක් මත අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන අයදුම් පතක් (ලියාපදිංචි හෝ පරීක්ෂණ සඳහා ඉදිරිපත්කරන) ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

I. අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම.
II. අදාළ ගාස්තු නිසිපරිදි ගෙවා නොතිබීම.
III. අයදුම්කරු විසින් පිළියෙල කරගනු ලැබූ ආකෘති පත්‍රයක් මගින් අයදුම් කර තිබීම.
IV. ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබීම.
V. ඉකුත් වර්ෂයක නිකුත් කරන ලද අයදුම්පතක් මගින් අයදුම් කර තිබීම.
VI. අදාළ තොරතුරු පැහැදිලිව දක්වා නොතිබීම සහ දක්වා ඇති තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම.
VII. නියමිත දිනට පසු අයදුම්පත් ඉදිරිපත් කිරීම.

## 16. පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර

සෑම පරීක්ෂණයක් ම ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු අපේක්ෂකයන් වෙත පරීක්ෂණය සඳහා අදාළ ප්‍රවේශ පත්‍ර අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. නියමිත කාලසීමාව තුළ එවැන්නක් බාගත කර ගැනීමට නොලැබුණහොත්, ඒ බව දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත දැනුම් දී අනතුරුව අනුපිටපතක් ලබා ගත හැකිය.

17. **පරීක්ෂණ සඳහා පෙනී සිටීම.**

(අ). අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව ලියාපදිංචි සෑම අපේක්ෂකයෙකුම ඒ ඒ උපාධි පාඨමාලාවලට අදාළ වර්ෂාවසාන පරීක්ෂණවලට පෙනී සිටිය යුතුය.

(ආ). පිළිගත හැකි වෛද්‍ය හේතු මත අනුමැතිය දී ඇති අවස්ථාවල දී හැර සෑම අපේක්ෂකයෙකු ම තමා ලියාපදිංචි වූ සෑම විෂයයක් සඳහා ම එකවර පරීක්ෂණවලට පෙනීසිටිය යුතුය.

(ඇ). පිළිගත හැකි වෛද්‍ය හේතු මත පරීක්ෂණයට ඉදිරිපත් වීමට හෝ පරීක්ෂණය සම්පූර්ණ කිරීමට හෝ අපොහොසත් වන අපේක්ෂකයෙකුහට පන්ති සාමාර්ථ්‍යයක් පිරිනැමීම සලකා බලනු ලබන්නේ අදාළ පරීක්ෂණය සඳහා නැවත ඉදිරිපත් වීමට ලැබෙන ප්‍රථම අවස්ථාවේදී ම සම්පූර්ණ පරීක්ෂණයට එකවර පෙනී සිට ගෞරව සාමාර්ථ්‍යයක් ලැබීමට සුදුසු මට්ටමකින් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූලව එකී පරීක්ෂණයෙන් සමත් වී ඇති බව පරීක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නේ නම් පමණි.

- අනුමත වෛද්‍ය හේතුන්මත නැවත පරීක්ෂණවලට පෙනී සිටින අපේක්ෂකයන් ද නියමිත සම්පූර්ණ විභාග ගාස්තු ගෙවිය යුතුය.

(ඈ). කිසියම් විෂයයකින්/විෂය ඒකකවලින්/පත්‍රවලින් අසමත් හෝ ඌන සාමර්ථ්‍යය හෝ ප්‍රතිඌන සාමාර්ථ්‍යය ලැබූ අපේක්ෂකයින් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූලව එකී පරීක්ෂණවලට නියමිත කාලවකවානු තුළ නැවත පෙනී සිට සිය ඌනතා සම්පූර්ණ කළ යුතු වේ.

- විභාගයට පෙනී නොසිටීම

  සෑම විද්‍යාර්ථියකු ලියාපදිංචිවන සියලු ම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම පෙනි සිටිය යුතුය. කිසියම් පාඨමාලා ඒකකයකට පෙනි නොසිටීම පිළිබඳව විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලයට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර විභාගයට පෙනි නොසිටියහොත් අදාළ විභාගයට නොපැමිණි වශයෙන් සඳහන් කරණු ඇත.

## 18. විභාග නීති හා අපේක්ෂකයින්ට උපදෙස්

(අ) විභාග අපේක්ෂකයෙකු පරීක්ෂණයට පෙනී සිටින සෑම අවස්ථාවකදීම බාහිර විභාග අංශය මගින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ජාතික හැඳුනුම්පත තමන් සතුව තබාගත යුතු වේ. විභාග ශාලාවක දී ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී සිය ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට විභාග අපේක්ෂකයින් බැඳී සිටින අතර, එසේ නොකරන අවස්ථාවල දී සිය විභාග අපේක්ෂකත්වය පවා අවලංගු කිරීමට ඉඩ ඇති බව සියලු විභාග අපේක්ෂකයින් තේරුම්ගත යුතුය. විභාගයට පෙනී සිටින අතරතුර සිය ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුව හොත් නොපමාව බාහිර විභාග අංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී දැනුවත්කොට අවශ්‍ය උපදෙස් ලබාගත යුතුය.

(ආ) කිසියම් අපේක්ෂකයෙකු පරීක්ෂණයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටිය නොහැකි වන සේ රෝගාතුර වුවහොත් ඒ බව වහාම බාහිර විභාග අංශය වෙත ලිඛිත ව දැනුම් දිය යුතුය. රෝගාතුර වූ දින සිට ලිත් මසක් ඇතුළත ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුගෙන් හෝ රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මසක කාලය ඉකුත්වීමෙන් පසු ඉදිරිපත් කරන වෛද්‍ය සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) අභියාචනා ඉදිරිපත් කිරීම

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනි සිටීමට නොහැකි වු සිසුන්ට අභියාචනා ඉදිරිපත් වීම මඟින් ප්‍රථම වරට පෙනි සිටින අපේක්ෂකයෙකු ලෙස අදාළ විභාගයට පෙනි සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ ලබා ගත යුතුය. අසමත් වු විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.

(ඈ) අසමත් වු විෂයන් සඳහා නැවත පෙනි සිටිම

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහල අසමත් ශ්‍රේණි ( C-/D+/D/E) ලබාගත් විද්‍යාර්ථියකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනිම සඳහා නැවත විභාගයට පෙනි සිටිය හැකිය. මෙහිදි විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගත හොත් කලින් තිබු ශ්‍රේණියම උපාධියට ගණනය කරණු ලැබේ.

විභාග පිළිබඳ වැඩිදුර උපදෙස් විභාග අයදුම්පත්‍රය සමග අපේක්ෂකයන් වෙත නිකුත් කරනු ලැබේ.

**19. විභාග අක්‍රමිකතා**

- ❖ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවලදී සටහන්, ලිපිලේඛන, ජංගම දුරකතන ආදිය විභාග ශාලාවට රැගෙන ඒම හා ඒවා ළඟ තබා ගැනීම හෝ භාවිත කිරීම.
- ❖ විශ්වවිද්‍යාලය මඟින් සපයනු ලබන ලිපිද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම.
- ❖ කොපිකිරීම, කොපිකිරීමට උදවු කිරීම හෝ ඒ සඳහා අනුබල දීම.
- ❖ වෙනත් අයෙකු නමින් පරීක්ෂණවලට පෙනී සිටීම.
- ❖ අසංවර හැසිරීම හා වෙනත් ඕනෑම ආකාරයක වංචනික ක්‍රියා.

විභාග පැවැත්වෙන අවස්ථාවලදී අපේක්ෂකයන් විසින් සිදුකරනු ලබන අක්‍රමිකතා ඔප්පු වුවහොත් පහත සඳහන් දඬුවම් එකක් හෝ කිහිපයක් නියම කිරීමට විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූලව කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට බලය පැවරී ඇත. එසේ නියම කරනු ලැබිය හැකි දඬුවම් කිහිපයක් මෙසේය:

- ❖ විභාග අක්‍රමිකතා සඳහා දැනට පනවා ඇති අවම දඬුවම වන්නේ වසර තුනක (03) කාලයක් දක්වා කිසිදු පරීක්ෂණයකට පෙනීසිටීම තහනම් කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් දඬුවම්වලින් එකක් හෝ කිහිපයක් නියම කිරීමට ද සනාතන සභාවට බලතල ඇත.

- ❖ අදාළ පත්‍රය/විෂය ඒකකය සඳහා වූ අපේක්ෂකත්වය හෝ විභාග අපේක්ෂකත්වය සම්පූර්ණයෙන් අවලංගු කිරීම.
- ❖ ලියාපදිංචිය අත්හිටුවීම/අවලංගු කිරීම.
- ❖ දඩයක් සහිතව හෝ රහිතව කිසියම් කාල සීමාවකට විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.
- ❖ විශ්වවිද්‍යාල සනාතන සභාව නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවමකට යටත් කිරීම.

**20. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතියට යටත්ව කිසියම් පරීක්ෂණයක ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ වහාම අන්තර්ජාලය මඟින් විභාග ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කරනු ඇත.

❖ උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම

උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරණු ලබන්නේ අදාළ වර්ෂ තුන ඉකුත් විමෙන් පසු සියලුම වර්ෂවල (ස්තර තුනේම/හතරේම) ප්‍රතිඵල සලකා බලා අවසන් ප්‍රතිඵල ගණනය කොට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුවය.

**20.1 විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම**

(අ) කිසියම් අපේක්ෂකයෙකු පිළිගත හැකි වෛද්‍ය හේතු මත අදාළ පරීක්ෂණවල සියලු අවශ්‍යතා සම්පූර්ණකර නොමැති අවස්ථාවල දී අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නා තෙක් ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත්කිරීම අත්හිටුවනු ලැබේ.

(ආ)කිසියම් අපේක්ෂකයෙකු විභාග අක්‍රමිකතා සඳහා දඬුවම් ලබා සිටින අවස්ථාවල දී ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම තහනම් කරනු ලැබේ.

**21. පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කිරීම.**

මොනම හේතුවක් නිසා හෝ උපාධි පාඨමාලාවලට අදාළ පිළිතුරුපත්‍ර නැවත සමීක්ෂණය සඳහා අවසර දෙනු නොලැබේ.

**22. සහතික පත්‍ර නිකුත් කිරීම**

**22.1 සහතික නිකුත් කිරීම**

ලියාපදිංචි වීමෙන් පසු ප්‍රථම/දෙවන/තෙවන වසර තුළ දී විද්‍යාර්ථීන්ට අතවශ්‍ය කාරණයකට ඉල්ලීමක් කළ පසු අධ්‍යයන වාර්තාවක් (Partial Grade Report) මුදල් ගෙවා ලබා ගත හැක. අවසන් ප්‍රතිඵල නිකුත් කොට සනාතන සභාවේ අනුමැතියෙන් පසු ලබා දෙන විස්තර සහිත අධ්‍යයන සහතිකය (Academic Record) උපාධිය සමත් වන සෑම විද්‍යාර්ථියෙකු සඳහා ම ආයතනය මඟින් නිකුත්

කරන අතර එහි අතිරේක සහතිකය අවශ්‍ය නම් මුදල් ගෙවා ලබා ගත යුතුය. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍යතාවය මත ලබා දෙන ලකුණු විස්තර සහිත රහස්‍ය අධ්‍යයන වාර්තාව (Academic Transcript) එම ආයතනයේ ලිපිය සමඟ විද්‍යාර්ථීන් විසින් ඉල්ලුම් කොට මුදල් ගෙවූ පසු එම ආයතනයට ලැබීමට සලස්වනු ඇත.

**22.2 උපාධි සහතික නිකුත් කිරීම**

උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරුව නියම කර ගන්නා දිනයන් හි කැලණි විශ්වවිද්‍යාලය මඟින් උපාධි සහතික නිකුත් කරනු ලැබේ.

**22.3. උපාධි සහතික**

උපාධි පරීක්ෂණයක ප්‍රතිඵල කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලකසභාව විසින් අනුමත කරනු ලැබූ පසුව උපාධි ප්‍රදානෝත්සවයේදී අදාළ උපාධි සහතික උපාධිධාරීන් වෙත නිකුත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

**22.4. උපාධි ප්‍රදානෝත්සවය.**

නියමිත උපාධි පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර ඇති සියලුම උපාධිලාභීන් වෙත කැලණිය විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයක දී අදාළ උපාධි පිරිනැමීම සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් සියලු විධි විධාන යොදා ඇත.

**22.5 ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය**

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සාර්ථක ලෙස සහ අදාළ නිර්ණායකවලට යටත්ව සම්පූර්ණ කරන උපාධිලාභීන් වෙත සනාතන සභාවේ අනුමැතිය පරිදි මතු සඳහන් ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළක් දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ක්‍රියාත්මක කොට ඇත. ඒ ඒ වර්ෂවල උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවන්හි දී මෙම ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කරනු ලැබේ.

- කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජයීය විද්‍යා පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව

- කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව
    - i. වාණිජ විද්‍යාවේදී උපාධි පාඨමාලාව
    - ii. ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලාව

ඒ ඒ පීඨවලට අදාළ නිර්ණායකවලට යටත්ව ඉහළම කුසලතා දක්වන උපාධි ලාභියා වෙත ඉහත දක්වා ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

**23. පරීක්ෂණ සඳහා අදාළ පැවරුම්**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණවලට අදාළ ඇතැම් පාඨමාලා ඒකක සඳහා පරීක්ෂණ අවශ්‍යතා ලෙස පැවරුම් ලබාදීමට දැනට අධ්‍යයන අංශ කිහිපයක් විසින් කටයුතු යොදා ඇත. එම අවශ්‍ය උපදෙස් විභාග අපේක්ෂකයන්ට සපයනු ලැබේ.

අදාළ පැවරුම් ලබා දිය යුතු අවසන් දිනයන් සම්මන්ත්‍රණවල දී දැනුම් දෙනු ලැබේ. එක් පැවරුමක් සඳහා රු. 300/- ක පරීක්ෂණ ගාස්තුවක් ගෙවිය යුතු අතර,එම විෂය ඒකකයන් අයත් වන අධ්‍යයන අංශ විසින් අධ්‍යයන කටයුතු ඒ ඒ වසරවලදී ආරම්භ වන විට පැවරුම් ඉදිරිපත් කළ යුතු විෂය ඒකකයන් මොනවාද යන්න ප්‍රකාශයට පත් කෙරේ.

- පැවරුම් සම්බන්ධ වැඩිදුර උපදෙස් හා විස්තර අන්තර්ජාලය හරහා සඳහා අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**නියමිත දිනට පසුව ලැබෙන පැවරුම් කිසිම හේතුවක් නිසා බාරගනු නොලැබේ.**

**24. වෙනත් කරුණු**

සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන සියලු විමසීම්වල දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

### 24.1 පැමිණ විමසීම්

බාහිර විභාග අංශය වෙත පැමිණ ඔබට අදාළ පාඨමාලාව සම්බන්ධ තොරතුරු විමසීම් සඳහා සතියේ **බදාදා** සහ **සිකුරාදා** යන දිනයන්හි පෙ.ව.10.00 සිට 12.00 දක්වාත් ප.ව. 1.30 සිට 3.00 දක්වාත් කාලය වෙන්කර ඇත.

### 24.2 දුරකතන විමසීම්

බාහිර විභාග අංශයෙන් ඔබට අවශ්‍ය තොරතුරු දුරකතනය මගින් විමසීම් සඳහා ද සතියේ දිනවල පෙ.ව. 9.00 සිට 3.00 දක්වාත් කාලය වෙන් කර ඇත.

### 24.3 ලිඛිත විමසීම්

බාහිර විභාග අංශයේ ඔබට අදාළ බාහිර උපාධි පාඨමාලා සම්බන්ධව හෝ අදාළ පරීක්ෂණ සම්බන්ධව ලිඛිතව කරුණු විමසීමේ දී මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද ලිපියකින් අදාළ විමසීම් කළ යුතු අතර, එවැනි විමසීම් සඳහා පිළිතුරු එවීම පිණිස නියමිත වටිනාකමින් යුත් මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද එවිය යුතුය. ලිඛිත විමසීම් එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ කාරණය ඉතා පැහැදිලිව සටහන් කළ යුතු වේ.

**<u>දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන ලිඛිත විමසීමක් සඳහා ආදර්ශ ආකෘති පත්‍රය</u>**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
නො. 56/6
කෝන්ගහවත්ත පාර
නුවර පාර
කිරිබත්ගොඩ

1. නම :- ............................................................

ලිපිනය :- ............................................................

2. ශිෂ්‍ය අංකය :- ....................................................

3. විභාග අංකය :- ..................................................

4. කාරණය :- ........................................................
(ඉතා කෙටියෙන් සඳහන් කරන්න.)

5. අමුණා ඇති ලේඛන:- ............................................

දිනය :-..................................................................

ශිෂ්‍යයාගේ දුරකතන අංකය :-.....................................

ශිෂ්‍යයාගේ අත්සන :-..............................................

**යෝජනා සහ පැමිණිලි**

ඔබගේ අදහස්, යෝජනා සහ පැමිණිලි ඇත්නම් ඒ සියල්ල පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,

නො. 56/6,

කෝන්ගහවත්ත පාර,නුවර පාර,

කිරිබත්ගොඩ.

විමසීම්: -

**දුරකතන අංක** - 011 2987000

011 2987001

011 2987002

011 2987005

E-mail: cdce@kln.ac.lk

Web site :-***www.cdce.kln.ac.lk***

## බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි

- බාහිර උපාධි පාඨමාලාවලට අදාළව පෞද්ගලික උපකාරක පංති/ආයතනවල ඉගැන්වීම් කටයුතු කරන කිසිදු ආචාර්යවරයකු ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ හෝ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේ හෝ කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගී කරගනු නොලැබේ.

- බාහිර උපාධි පාඨමාලා සඳහා පෞද්ගලික උපකාරක පංති පැවැත්වෙන කිසිදු ආයතනයකට කැලණිය විශ්වවිද්‍යාලයීය බාහිර විභාග අංශය යටතේ ලියාපදිංචි ආයතනයක් වශයෙන් හෝ අනුබද්ධ ආයතනයක් වශයෙන් හෝ කටයුතු කිරීමට අයිතියක් ලබා දී නොමැත.

සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් මෙම ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර අදාළ උපාධි පාඨමාලාව හදාරා අවසන් වන තුරු මෙම අත්පොත සුරැකිව තබා ගන්නා ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

**මෙම අත් පොතෙහි සඳහන් ඕනෑම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සම්පූර්ණ අයිතිය කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ.**

**කැලණිය විශ්වවිද්‍යාලයීය දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ප්‍රකාශනයකි.**

ප්‍රකාශනය

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශ්‍රී ලංකාව**



web: www.cdce.kln.ac.lk / e-mail: cdce@kln.ac.lk

web: www.cdce.kln.ac.lk
e-mail: cdce@kln.ac.lk